**ශිර්ෂ 186 - සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.1 විගණන විෂය පථය**

සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන, පොත් පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරන විගණන වාර්තාව 2015 අගෝස්තු 06 දින අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කරන ලදී. ගිණුම හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගෙන් විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදන හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 267.3 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 229.0 ක් උපයෝජනය කර කර තිබුණි. ඒ අනුව රු.මිලියන 38.3 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14.4 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 172.3 | 149.2 | 23.1 | 13.4 |
| මූලධන | 95.0 | 79.8 | 15.2 | 16.0 |
| **එකතුව** | **267.3** | **229.0** | **38.3** | **14.4** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂයේ | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18601 | 2.0 | 1.5 | 0.1 | 2.3 | 7.0 | 3.5 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 272,059 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

---------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂ 186 - සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය**

---------------------------------------------------

**3.1 විසර්ජන ගිණුම**

-----------------

**අයවැය විචලනය**

-----------------

වැය විෂයයන් 4 ක් සඳහා රු.986,526 ක අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 අනුකූල නොවීම**

-----------------

**නීති , රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නීති රීති රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 1647 (ආ) | වාහන හා වාහනවලට සම්බන්ධ උපකරණ පිළිබඳ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි. |
| **(ආ)** | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | |
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |

**3.3** **අනාර්ජික ගනුදෙනු**

**-----------------------**

2013 නොවැම්බර් 01 දින සිට 2014 ඔක්තෝබර් 31 දින දක්වා වසරකට කාලයක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත උපදේශක තනතුරට නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. නමුත් අමාත්‍ය මණ්ඩල තීරණයකින් තොරව එම බඳවාගත් නිලධාරියාට 2014 නොවැම්බර් හා දෙසැම්බර් මාස දෙක සඳහා එකතුව රු.196,940 ක පාරිශ්‍රමික ගෙවා තිබුණි.. මෙම උපදේශක වෙත කාර්යය පැවරුම් හා ඔහු විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**--------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 9 | 5 | 4 |
| (ii) | තෘතියික මට්ටම | 1 | 1 | - |
| (iii) | ද්විතියික මට්ටම | 22 | 12 | 10 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 14 | - |
| | **එකතුව** | **46** | **32** | **14** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 14 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.